# ශ්‍රී ලංකාවේ අලි




ආයුබෝවන්! ශ්‍රී ලංකාවට ඔබව සාදරයෙන් පිළිගනිමු! ආසියානු අලි, ලංකාවේ සංකේතාත්මක සත්ත්ව විශේෂයක් වන අතර, ඔවුන් මිනිසුන් මෙන්ම දිගුකාලයක් ජීවත්වන, බුද්ධිමත් සහ සමාජශීලී සතුන් වේ. එසේම, ඔවුන් ලංකාවේ ජීවත්වන ඉතාම සුවිශේෂී සත්ත්ව විශේෂයකි. එම නිසා, ඔබ අද දින මෙම වනෝද්‍යානය තුළ සංචාරය කිරීමේදී, අලි ඇතුන් ඇතුළු අනෙකුත් සියලුම වන සතුන්ට හිරිහැර නොවන පරිදි, ඔබගේ සංචාරය සිදුකිරීම සඳහා වගබලා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

## ආසියානු අලි සමාජය

අලින්ට ඇත්තේ ගැහැණු සතුන් මූලික කරගත් සමාජ වටපිටාවකි. ගැහැණු අලින් ඉංග්‍රීසි බසින් “cow” ලෙසද, සිංහල බසින් “කෙණෙර” ලෙසද හැඳින්වේ. ගැහැණු අලි කුඩා කණ්ඩායම්/සමූහ ලෙස ජීවත්වන අතර, එම කුඩා කණ්ඩායම් ඥාතීවන ගැහැණු අලි කිහිපදෙනෙකුගෙන් හා පැටවුන්ගෙන් සමන්විත වේ. මෙම ගැහැණු අලි දවස පුරා හෝ සෘතුව පුරා තාවකාලිකව එකතුවීම් හෝ උප කණ්ඩායම්වලට බෙදීම් පෙන්නුම් කරයි. මෙය ඉංග්‍රීසි බසින් “fission–fusion” ලෙස හඳුන්වයි. ඔබ වනෝද්‍යානය හරහා ගමන් කරනවිට, අලි මව්වරුන් සහ ඔවුන්ගේ පැටවුන් අතර ඇති දැඩි බැඳීම ඔබට දැකගත හැකිවේ. මිනිස් දරුවන් වාගේම අලි පැටවුනුත් දීර්ඝ කාලයක් යනතුරුම, තම මව සහ පවුලේ සාමාජිකයන් මත යැපේ. වැඩිවිය පැමිණීමෙන් පසු පිරිමි අලින් (ඉංග්‍රීසි බසින් “bulls” ලෙස හඳුන්වයි) වඩා ශක්තිමත් වන බැවින්, ඔවුන් ගැහැණු අලි කෙරෙහි රළු/දැඩි හැසිරීම් පෙන්වන අතර, එම කාලයේදී ඔවුන් තමන් ඉපදී හැදී වැඩුනු තම රංචුව අතහැර යයි. තරුණ පිරිමි අලින්, අනෙකුත් තරුණ පිරිමි අලි සමඟ ලිහිල් ඇසුරක් පවත්වා ගෙන යන නමුත්, වැඩිහිටි පිරිමි අලි හුදකලාව විසීමට වැඩි නැඹුරුවක් දක්වයි. පිරිමි අලි ඔවුන්ගේ ඉතිරි ජීවිත කාලය පුරාම එකිනෙකා සමඟ සමාජශීලී වෙමින්, ආහාර, ජලය සහ ප්‍රජනන අවස්ථා සොයාගැනීම සඳහා ගැහැණු අලි කණ්ඩායම් අතර සැරිසරයි.

### ගැහැනු


ප්‍රසූතියෙන් පසු ගැහැනු අලින්ගේ ශ්‍රෝණිය හතරැස් හැඩැති පසුපසක් සාදයි.



ආසියානු ගැහැණු අලින්ට දළ නොමැති නමුත් තොල්වලින් ඔබ්බට නොයන “කුඩා දළ” තිබිය හැකිය.

### පිරිමි

ශ්‍රී ලංකාවේ ඇතැම් පිරිමි අලින්ට පමණක් දළ ඇත. දළ ඇති පිරිමි අලි හඳුන්වන්නේ “ඇතුන්” ලෙසිනි.



## අලි වෙන් වෙන්ව දැන හඳුනා ගන්න

අලි වෙන් වෙන්ව ගත්විට, මිනිසුන් මෙන්ම ඔවුන්ටම ආවේණික පෞරුෂයන් හා ලක්ෂණ වලින් යුක්ත වේ. අලි එකිනෙකා සමග සහ ඔවුන්ගේ පරිසරය සමග දක්වන අන්තර් ක්‍රියාකාරකම් පිළිබඳ හොඳින් අවබෝධ කර ගැනීම සඳහා, අලි වෙන් වෙන්ව හඳුනා ගැනීම සිදු කල යුතු අතර, ඒ සඳහා පර්යේෂකයන් විසින් ඔවුන්ගේ බාහිර ලක්ෂණ උපයෝගී කර ගනී. මෙය තනි අලින් කාලයක් තිස්සේ නිරීක්ෂණය කිරීම සඳහාද ඉතා වැදගත් වේ. අද දින ඔබ නිරීක්ෂණය කරන අලි හඳුනා ගැනීමට භාවිතා කල හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

### කන්වල හැඩය



### වලිගය



### ඇත් දළ



# වගකිවයුතු සංචාරකයෙකු/මඟ පෙන්වන්නෙකු වෙන්න

ශ්‍රී ලංකාවේ අලි, ජීවත්වන්නේ මිනිස් ආධිපත්‍යට නතු වූ පරිසර පද්ධති වල වන අතර වනෝද්‍යාන පවා එම ආදිපත්‍යට නතු වී ඇත. එබැවින්, වනෝද්‍යානය තුළ සංචාරය කිරීමේදී අපි හැසිරෙන ආකාරය, අලින්ගේ එදිනෙදා ජීවිතයට විශාල බලපෑමක් ඇති කරයි. එම නිසා, අලි මිත්‍රශීලී සංචාරකයෙකු වීමට පහත උපදෙස්, ඔබ වාහනය තුළ සිටියදීම අනුගමනය කරන්න.

අලි ඔවුන්ට තර්ජනයක් දැනෙන අවස්ථාලදී පරීක්ෂාකාරී ලෙස කන් පිටතට යොමාගෙන සිටිනු දැකිය හැක. ඔබ අලියෙකුට අනවශ්‍ය ලෙස සමීප වී ඇති බව හා එයින් අලියා පීඩාවට පත්ව ඇති බව ඇඟවෙන හොඳම සංඥාවක් වන්නේ එම අලියාගේ කලහකාරී හැසිරීමයි.

ආසියාතික අලි පීඩාවට පත් වූ විට අනතුරු ඇඟවීමේ සංඥාවක් ලෙස කුංචනාද කිරීම සිදුකරයි. ඔබගේ වාහනය ඔවුන් අසලට ගමන් කරන විට, ඔවුන් එලෙස කුංචනාද කරයි නම් හෝ විශාල ශබ්දයක් නිකුත් කරයි නම්, ඔවුන් සන්සුන් වන තුරු (ඔබගේ පැමිණීම ඔවුන්ට බාධාවක් නොවන තුරු) ඔවුන් අසලට ඔබගේ වාහනය ළඟා කිරීමෙන් වලකින්න.

යම් අනතුරු සහගත බවක් ගැහැණු අලින්ට දැනුනු විට, ඔවුන් වහාම ඔවුන්ගේ පැටවුන් වටා ආරක්ෂිත කවයක් සාදා ගනී. එම නිසා, ඔබගේ වාහනයේ පැමිණීමෙන් අලි කණ්ඩායමේ සාමාජිකයන් එකිනෙකාගෙන් වෙන් නොකිරීමට වග බලා ගන්න.

පිරිමි අලි සාමාන්‍යයෙන් වසරක් පාසාම මද කිපීමට ලක්වන අතර, මෙම කාලසීමාව ඔවුන්ගේ ප්‍රජනන ක්‍රියාකාරකම්වල උච්චතම කාලසීමාව වේ. මද කිපුණු කාලයේදී පිරිමි අලි විශේෂයෙන්ම මිනිසුන් කෙරෙහි ආවේගශීලී/ප්‍රචණ්ඩකාරී විය හැකිය. අලින්ගේ මුහුණේ දෙපස ඇති ග්‍රන්ථි වලින් ස්‍රාවයක් වෑස්සීම හා නිතර මූත්‍රා වෑස්සීම ඔවුන් මද කිපී ඇති බවට පැහැදිලි සලකුණු වේ. එම අවස්ථා වලදී ඔවුන්ට නිදහසේ සිටීමට අවකාශ ලබා දීමට වග බලා ගන්න.






ඔබගේ වාහනය අලි සමූහයක් වෙත ලඟා වීමේදී, අවම වශයෙන් මීටර 10ක පරතරයක්වත් තබා ගන්න. එසේම, අලි නැරඹීමේදී හැකියාවක් පවතී නම්, වාහනයේ එන්ජිම ක්‍රියාවිරහිත කරන්න. එලෙසම, එකිනෙකා සමඟ කථා කිරීමේදී පහත් හඩින් කථා කරන්න. අපගේ පර්යේෂණ වලින් අනාවරණය වූ පරිදි, ඔබගේ වාහනය මීටර් 10ක් ඇතුළත පවතින විට, අලි ඔවුන්ගේ සාමාන්‍ය හැසිරීම් රටාවෙන් බැහැර වී පීඩාකාරී හැසිරීම් රටා පෙන්නුම් කරයි. අලි නිදහසේ සිටින විට ආහාර ගැනීම, ස්නානය කිරීම, එකිනෙකා සමඟ සමාජශීලී වීම වැනි සාමාන්‍ය හැසිරීම් රටා පෙන්නුම් කරයි.

## ශ්‍රී ලංකා අලි ව්‍යාපෘතිය

**ශ්‍රී ලංකා අලි ව්‍යාපෘතිය** යනු, අලින්ගේ ජීවිත හා ඒ අවට වාසය කරන මිනිසුන්ගේ සුබ සිද්ධිය උදෙසා පර්යේෂණ කටයුතු සිදු කරන, සංරක්ෂණවේදීන්ගෙන් සැදුම්ලත් ව්‍යාපෘතියකි. ආසියානු අලි වඳවීමේ තර්ජනයට ලක්ව ඇතිසත්ත්ව විශේෂයක් වන අතර, අප පර්යේෂණ කණ්ඩායම අලි සංරක්ෂණය කිරීමේ අරමුණ සහිතව, අලින්ට හිංසාවක් නොවන ලෙස ඔවුන්ගේ ගහනයේ විකාශනය, හැසිරීම් රටා සහ සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය කරන්නෙමු. එසේම, අපි අලි සිටින ප්‍රදේශ අවට ජීවත්වන ග්‍රාමීය ජනතාව මුහුණදෙන අභියෝග පිළිබඳ සොයා බැලීමට කටයුතු කරන අතර එමඟින්, අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා තිරසාර විසඳුම් ලබා දීමට සහයෝගය දක්වමු. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ ඊළඟ පරම්පරාවේ සංරක්ෂණවේදීන් පුහුණු කිරීමට ලැබීම පිළිබඳවත් අපි ඉතා ආඩම්බර වෙමු.

OKLAHOMA CITY ZOO + BOTANICAL GARDEN

**වැඩි විස්තර සඳහා www.LankaElephants.org වෙත පිවිසෙන්න.**